# සති පාසල් කාර්ය පත්‍රිකාව

1.පන්තිය: 11 විෂයය: තොරතුරු සන්නිවේදන තාක්ෂණය සතිය: නොවැම්බර් 04

2. පාඩම: තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතයේදී ආරක්ෂාව සම්බන්ධව මතුවන ගැටළු හා ඒවාට පූර්වෝපායයන්

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

(i) ඔබ පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීමේදී ඔබට පැනනැගුණු ගැටළු හඳුනාගෙන ඒවා ලැයිස්තු ගත කරන්න. තවද එම ගැටළු වලට අමතරව පොදුවේ පරිගණක විද්‍යාගාරයක් භාවිතයේදී පැනනැගිය හැකි ගැටළුද එම ලැයිස්තුවටම එකතු කරන්න.

(ii) ඔබ විසින් හඳුනාගත් ගැටළු විසඳාගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගන්න. මේ සඳහා අන්තර්ජාලයෙන් හා ඔබගේ පෙළපොත මගින් තොරතුරු එක්රැස් කරන්න.

(iii) හඳුනාගත් ගැටළු හා ඒ සඳහා විසඳුම් වගුවක් මගින් නිරූපණය කරන්න.

4. ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත් පත් website, LMS හා ඉගෙනුම් ආධාරක:

[www.ru.ac.za](http://www.ru.ac.za)

[www.bbc.co.uk](http://www.bbc.co.uk)

[www.techrepublic.com](http://www.techrepublic.com)

[www.youtube.com](http://www.youtube.com)

5. ඉගෙනුම් ඵල:

(i) තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතයේදී ආරක්ෂාව හා සම්බන්ධව ගැටළු මතුවන බව ප්‍රකාශ කරයි.

(ii) තොරතුරු සන්නිවේදන තාක්ෂණයේදී ආරක්ෂාව හා සම්බන්ධව මතුවන ගැටළු ලියා දක්වයි.

(iii) තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතයේදී ආරක්ෂාව හා සම්බන්ධව මතුවන ගැටළු වලට පිළියම් සාකච්ජා කරයි.

සැකසුම : කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල.